# යාන් ඔය නිම්නයේ පූර්ව ඓතිහාසික අවධියේ ජනාවාස ව්‍යාප්ත වීමේ මෝස්තරය පිළිබඳ ව සිදු කරන පුරාවිද්‍යා විමසුමක්

**ඩී. තුසිත මැන්දිස්**

යාන් ඔය මධ්‍ය කඳුකරයේ උතුරු බෑවුමෙන් එ නම් සීගිරි නිම්නයෙන් ආරම්භ ව පුල්මුඩේ ප්‍රදේශයෙන් මුහුදට වැටෙන ගංගාවකි. මධ්‍ය යාන් ඔය නිම්නය ගත්කල එහි පුළුල් නිම්න ප්‍රදේශයකට අයත් භූ වපසරිය පමණක් වර්ග කිලෝමීටර් 1400කි. යාන් ඔය නිම්නයේ පූර්ව ඉතිහාසයට අයත් සුසාන ස්ථාන 34ක් කාල රක්ත වර්ණ මැටි මෙවලම් හමුවන ස්ථාන 06ක් පමණ පවතින බව රංජිත් දිසානායක විසින් හඳුනාගෙන වාර්තා කර තිබේ **(2017 වර්ෂයේ රංජිත් දිසානායක සමඟ සිදු කළ සාකච්ඡාවක් ඇසුරිනි)** ශ්‍රී ලංකාවේ උතුරුමැද පළාතේ පූර්ව ඓතිහාසික සංස්කෘතියට අදාළ පැරණිතම සාධක දැනට වාර්තා වන්නේ අනුරාධපුර ඇතුළු පුරයෙනි. විකිරණමාන දින නියම කිරීම් හා ඔක්ස්කැල් කාලනිර්ණ කිරීම් අනුව එම සංස්කෘතිය ක්‍රි. පූ. 1000 තරම් ඈතට ගමන් කරන බව මේ වනවිට තහවුරු කරගෙන තිබේ **(Deraniyagala 1992 (707-712 : Deraniyagala & Abyerathne: 707-731)**. අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැඩිම පූර්ව ඓතිහාසික යුගයට අයත් ජනාවාස හා සුසාන ස්ථානගත වී ඇත්තේ මධ්‍ය යාන් ඔය නිම්නය ආශ්‍රිත ව ය. දැනට වාර්තා වන ආකාරයට පූර්ව ඓතිහාසික සංස්කෘතියට අයත් සුසාන ස්ථාන 28ක් පවතින අතර එම සුසාන ස්ථානගත ව ඇති ස්ථාන වන්නේ වඩිගවැව, ගුරුගල්හින්න, කොක්එබේ, තම්මැන්නාගොඩැල්ල, දිවුල්වැව, මරදන්මඩුව, පරංගියාවාඩිය (නිකවැව), දික්වැව, ඇතාබැඳිවැව, පන්කැටියාව, පළුකැටිවැව, ගල්ඇඳකටුව, නෙළුගොල්ලාකඩවල, ඇලපත් වැව, මහපොතාන, බෙරවායගල, පන්වත්ත, පඩරැල්ලාව (රබෑව), මල්පෝරුවල, කිරිමැටියාව, ඕලුවැව, නෙතුගොල්ලෑව, කනගහඋල්පත, කරුවලගස්වැව, වාහල්කඩ, මාවතවැව, වලස්මුල්ල යන ස්ථානයන් ය.

මෙම ස්ථාන අතුරින් මේ වනවිට රේඩියෝ කාබන් දින නියම කිරීම් සිදු කර ඇත්තේ වාහල්කඩ ක්‍රි.පූ 400-200 **(එස්.ටී.ජී. ප්‍රියන්ත සමග සිදු කළ සම්මුඛ සාකච්ඡාව 2018)**. තම්මැන්නාගොඩැල්ල ක්‍රි. පූ.490-350 **(රංජිත් දිසානායක සමඟ 2017 සිදු කළ සම්මුඛ සාකච්ජාව)**. කොක්එබේ ක්‍රි.පූ 790-125 **(මැන්දිස් 2017: 177-**

**179).** ඒ අනුව දැනට සිදු කර ඇති අධ්‍යයන අනුව ලැබී ඇති දින නියම කිරීම්වලින් පැහැදිලි වන ප්‍රධාන කාරණයක් වන්නේ පූර්ව ඓතිහාසික සංස්කෘතිය අනුරාධපුර පැරණි නගරයෙන් නැගෙනහිර දිශාව තුළ ස්ථාපිත වී ඇත්තේ අනුරාධපුරයට වඩා වසර 200කට පමණ පසු ව බව ය. මෙය අතිශයින් ම වැදගත් වන්නේ යාන් ඔය නිම්නය ආශ්‍රිත පූර්ව ඓතිහාසික සංස්කෘතික පිරිස් අනුරාධපුරය හා ඉන් අවට කලාපයේ ස්ථානගත වනවාට වඩා මහා පරිමාණයෙන් මධ්‍ය යාන් ඔය නිම්නයේ කේන්ද්‍රගත වී තිබීම සැලකිය යුතු කාරණයකි. එසේ නම් අප විමර්ශනය කළ යුතු කාරණය වන්නේ පූර්ව ඓතිහාසික සංස්කෘතිය අනුරාධපුරය කේන්ද්‍රගත කරමින් ඉන් පිටත කලාප දක්වා ව්‍යාප්තවීමක් සිදු වී තිබේ ද? එසේ නොමැති නම් යාන් ඔය මධ්‍ය නිම්නයේ මෙම සංස්කෘතිය ආරම්භ වී ක්‍රමයෙන් අනුරාධපුර දෙසට ව්‍යාප්ත වූවා ද යන්න විමසීම ය. මේ පිළිබඳ ව විමසීමේ දී අවධානය යොමු කළ යුතු එක් කරුණක් වන්නේ මෙම සංස්කෘතිය ඉන්දීය මෙගලිතික සංස්කෘතියේ බලපෑම මත ඉන්දියාවේ දකුණු කොටසින් පිට වී ලංකාවේ නැගෙනහිර වෙරළ වන ත්‍රිකුණාමලය දෙසින් ලංකාවේ රට අභ්‍යන්තරයට ප්‍රවිෂ්ට වූවා ද? යන්න ය. එසේ වූයේ නම් මෙසේ ඇතුළු වූ පූර්ව ඓතිහාසික ජන පිරිස පුල්මුඩේ දෙසින් යාන් ඔය පහළ නිම්නයට ඇතුළු වී සාරවත් ආකර්ෂණීය භූමියක් වූ මධ්‍ය යාන් ඔය නිම්නයේ ස්ථාපිත වූවා ද? යන්න විමර්ශනය කිරීම වැදගත් වේ. විශේෂයෙන් මධ්‍ය යාන් ඔය නිම්නයේ මෙම ජනාවාස ස්ථානගත වීමේ දී කහටගස්දිගිලිය හා හොරොව්පොතාන ප්‍රදේශීය ලේකම් කොට්ඨාශවල පොකුරක් ආකාරයට ස්ථානගත වී තිබේ. දැනට ලැබී ඇති කාලනිර්ණ අනුව විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන්නේ පූර්ව ඉතිහාසයේ මුල් ම ජනපද මෙම මධ්‍ය යාන් ඔය නිම්නයේ ස්ථානගත වී ඇති බව ය. එසේ නම් ආරම්භක ජනපද මධ්‍ය යාන් ඔය නිම්නයේ ආරම්භ ව එහි සංස්කෘතියේ හා ජනරේඛනයේ ප්‍රසාරණ සමඟ ක්‍රමානුකූල ව යාන් ඔය පහළ නිම්නය වන පුල්මුඩේ දෙසටත් ඉහළ නිම්නය වන සීගිරි හා කලා ඔය නිම්න දෙසටත් ව්‍යාප්ත ඉන් පසු ව ව්‍යාප්ත වූවා ද යන්න විමසීම ද වැදගත් වේ. මේ සඳහා දැනට සිදු කර ඇති පුරාවිද්‍යා පර්යේෂණවලින් අනාවරණය කරගෙන ඇති තොරතුරු භාවිත කිරීමෙන් ඉතා හොඳ පිළිතුරක් සපයාගත හැකි ය. යම් ස්ථානයක ඇති වන ආරම්භක ප්‍රාථමික ජනාවාස එම ස්ථානයෙන් ප්‍රසාරණය වීම සඳහා ප්‍රධාන වශයෙන් ජීවනෝපාය ක්‍රමය (Subsystem pattern), තාක්ෂණ ශිල්පයේ දියුණුව (Technology), ජනාවාසරටාව (Settlement pattern) හා බහු සම්පත් යැපුම් රටාව (Malty Resource Use Pattern) බලපාන බව පුරාවිද්‍යාඥයන් පෙන්වා දී ඇත **(Senaviratne 1996: 277).** උාර්භයේ දී තැනින් තැනට ගමන් කරන එඬේර ජන පිරිසක් වූ පූර්ව ඓතිහාසික ජන පිරිස් ස්ථාවර ජනපද පිහිටුවා ගැනීම ආරම්භ කරනු ලබනුයේ සංස්කෘතික වර්ධනයත් සමඟ ය. සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වා දී ඇති ආකාරයට යම් ජනාවාසයක ජනගහනය වැඩිවීමෙන් පසු ඇති වන ජන ප්‍රසාරණය මත නව ජනපද ගොඩනැගෙන අතර ඒ සමඟ ම නව ජනපද බිහිවීම සිදු වේ **(එම).** එසේ ඇති වන ජනපද ප්‍රමාණයේ වර්ධනය සමඟ ඔවුන් එතෙක් ක්‍රියාත්මක කරන ලද තැනින් තැනට ගොස් ගතකල එඬේර ජීවන ක්‍රමය අවසන් වන අතර එ මගින් ලබාදෙන

අන්තර් සමාජ ක්‍රියාකාරීත්ව ක්‍රියාදාමයේ සමාජමය, ආර්ථික, දේශපාලන හා ආගමික, යනුවෙන් හැඳින්වෙන ආයතන හැඩ ගැසීම සිදු වේ **(එම)**. මෙසේ ආයතන ඇතිවීම සමඟ ස්ථාවර ජනපද ආරම්භ වන අතර එ වැනි ස්ථාවර ජනපද මධ්‍ය යාන් ඔය නිම්නයේ ස්ථාපිත වූ බව පැහැදිලි වන්නේ මහා පරිමාණ මෙගලිතික සුසාන භූමි සමූහයක් ක්‍රි.පූ. 800 යෙන් පසු ව එම නිම්නයේ දැකගත හැකි බැවිනි.

යාන් ඔය මධ්‍ය නිම්නයේ ස්ථානගත වන පූර්ව ඓතිහාසික ජනාවාස එම නිම්නයේ ස්ථාවර වීම සඳහා කාලය හා අවකාශය (Time / Space) තුළ ගොඩනැගෙන්නා වූ බහුවිධ කාරණා බලපාන්නට ඇත. විශේෂයෙන් ම අනුරාධපුර දිස්ත්‍රික්කයේ පූර්ව ඓතිහාසික සංස්කෘතියේ පැරණිතම සාධක අනුරාධපුර ඇතුළු පුරය ඇසුරින් මේ වන විට හඳුනාගෙන ඇති නමුත් අනුරාධපුර නගරය හා එහි තදාශ්‍රිත ප්‍රදේශ ආශ්‍රයෙන් එම සංස්කෘතිය පිළිබඳ ව  තොරතුරු වාර්තා වී ඇත්තේ ඉතා ම අල්ප වශයෙනි. මේ සම්බන්ධයෙන් අනුරාධපුර ඇතුළු පුරයෙන් ජනාවාසමය තත්වයන් **(Deraniyagala 1992:709-712)**. හා අභයගිරි විහාරය අභ්‍යන්තරයෙන් එක් සුසානයක් හා එම විහාරයට උතුරින් අශෝකාරාමයට ප්‍රවිෂ්ට වන මංසන්ධියේ සිට ගම්බිරිස්ගස් වැව මාර්ගයේ කි.මී 2ක් පමණ ගිය විට එම මාර්ගයේ සුසානයක් පවතින බව මෙම ලේඛකයා විසින් 2016 වර්ෂයේ සිදු කරන ලද ගවේෂණයක දී හඳුනාගෙන තිබේ **(මැන්දිස් 2016 : 85)**. පූර්ව ඓතිහාසික යුගයට අයත් සුසාන අනුරාධපුරය හා එහි තදාශ්‍රිත කලාපයේ දැකගැනීමට නො හැකි වන්නේ බෞද්ධ ආරාම එම භූමිවල ස්ථාපිත වීම සමඟ ම පූර්ව ඓතිහාසික යුගයට අයත් වන සුසාන වැනි අංග එම භූමිවලින් ගළවා ඉවත් කිරීම නිසා බව උපකල්පනය කළ හැකි ය. නමුත් අනුරාධපුර සමහර විහාරාරාම ආශ්‍රයෙන් පූර්ව ඓතිහාසික යුගයට අයත් ජනාවාස තොරතුරු වාර්තාවන බව මෙම ලේඛකයා විසින් 2000 - 2009 කාලයේ ජේතවන විහාරය හා වෙස්සගිරි විහාරය (පුරාණ ඉසුරුමුණිය) ආශ්‍රිත ව සිදු කර ඇති පුරාවිද්‍යා කැනීම්වල දී හමු වී ඇති භෞතික සංස්කෘතික තොරතුරුවලින් වාර්තා කර තිබේ **(මැන්දිස් 2006 : 252-271, 300-310)**. එසේ ම අභයගිරි විහාරය තුළ ද එහි නිරිත දිග දිශාවේ භූමිය මතුපිට දැකිය හැකි කාල රක්ත වර්ණ මැටි බඳුන් අනුව එම භූමිය තුළ ද පූර්ව ඓතිහාසික ජනාවාස පවතින්නට ඇති බව උපකල්පනය කළ හැකි ය. ඒ අනුව පූර්ව ඓතිහාසික යුගයේ දී අනුරාධපුර හා තදාශ්‍රිත කලාපයේ පූර්ව ඓතිහාසික සංස්කෘතික අවධිය සම්බන්ධ තොරතුරු යම් ප්‍රමාණයක් එම යුගයේ ජනාවාස හා සුසාන සම්බන්ධ ව පැවතිය ද පූර්ව ඓතිහාසික සංස්කෘතියේ සාර්ව මුල්බැස ගැනීම අනුරාධපුරය හා එහි තදාශ්‍රිත කලාපයට වඩා දැකගත හැක්කේ ඉන් නැගෙනහිරින් පිහිටි මධ්‍ය යාන් ඔය නිම්නය ආශ්‍රිත ව ය.

මහා පරිමාණ ලෙස ස්ථාපිත ව ඇති මෙගලිතික සුසාන සංකීර්ණවලින් මේ බව මැනවින් හඳුනාගත හැකි අතර ම මේ ආකාරයට විශාල සුසාන භූමි ප්‍රමාණයක් යාන් ඔය නිම්නයේ මුල්බැස ගැනීම සඳහා එක් අතකින් ත්‍රිකුණාමල වරායේ හා ලංකා පටුනට ආසන්න ඉලංගෙයිතුරෙයි පැරණි වරායේ  ස්ථානගත වීම ද බලපාන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය. පූර්ව ඓතිහාසික අවධියේ දී

ඉන්දියාවේ දකුණු දෙසින් සරල යාත්‍රා ඔස්සේ ඉතා පහසුවෙන් ත්‍රිකුණාමලයට හා ඉලංගෙයිතුරෙයි වරායට පැමිණිය හැකි ය (උදාහරණ වශයෙන් වර්තමානයේ උතුරු කරයේ ජනතාව මසුන් මැරීමට භාවිත කරන කට්ටුමරන් හෙවත් කටමරන් යනුවෙන් හැඳින්වෙන සරල යාත්‍රා වැනි යාත්‍රා භාවිත කර මෙම වරායන්ට පැමිණිය හැකි ය). ඒ අනුව පූර්ව ඉතිහාසය තුළ එසේ ජන කණ්ඩායම් පැමිණියේ නම් (ශ්‍රී ලංකාවේ නැගෙනහිර ප්‍රදේශයෙන් මුහුදට වැටෙන යාන් ඔයේ පහළ නිම්නය වන පුල්මුඩේ දෙසින් රට අභ්‍යන්තරයට ඇතුළු වී යාන් ඔය නිම්නයේ ඉහළට ගමන් කර මධ්‍ය කොටසේ ජනාවාස ස්ථානගත කර ඇති බව මේ වන විට සිදු කර ඇති පුරාවිද්‍යා පර්යේෂණවලින් පැහැදිලි වේ. විශේෂයෙන් ම යාන් ඔය පහළ, මධ්‍යම හා ඉහළ යන නිම්න තුනේ ම පූර්ව ඓතිහාසික අවධියට අයත් සුසාන භූමි 35ක් පමණ ස්ථානගත වී තිබීමමෙන් මේ බව මැනවින් තහවුරු කර ගත හැකි ය. එසේ ම අනෙක් අතට ලංකාවේ වෙනත් කිසිදු ගංගා නිම්නයකින් මෙ තරම් විශාල සුසාන භූමි ප්‍රමාණයක් වාර්තා නො වීම ද සුවිශේෂ ය. කෙසේ වෙතත් ඉදිරි පර්යේෂණවලින් ලබාගන්නා වූ විද්‍යාත්මක කාලනිර්ණ ඔස්සේ සිදු කරන අධ්‍යයනවලින් යාන් ඔය නිම්නයේ ජනාවාස ව්‍යාප්ත වීමේ මෝස්තරය හඳුනාගැනීමට වැඩි අවකාශයක් තිබුණ ද දැනට ලැබී ඇති කාල නිර්ණ අනුව ද එම නිම්නයේ පූර්ව ඓතිහාසික ජනාවාස ව්‍යාප්ත වීමේ මෝස්තරය හඳුනාගැනීමට අවකාශ සැලසේ.

මධ්‍ය යාන් ඔය නිම්නයේ පූර්ව ඓතිහාසික අවධියේ ජනාවාස ස්ථානගත වීම පිළිබඳ ව විමසීමක් කිරීමේ දී පැහැදිලි වන්නේ හැඩගැසෙමින් ඇති සමාජය ආර්ථික හා තාක්ෂණ ශිල්පය පදනම් කරගෙන සුවිශේෂ වූ අමුද්‍රව්‍ය සොයා යාන් ඔය මධ්‍ය නිම්නයට ප්‍රවිෂ්ට වන්නට ඇති බව ය. දැනට සිදු කර ඇති පර්යේෂණවලට අනුව ක්‍රි. පූ. 500-600 පමණ වන විට අනුරාධපුරය නාගරික තත්වයට පත් වී ඇත. එම කාලපරිච්ඡේදයට අදාළ ව හමු වී ඇති දෙස් විදෙස් මානවකෘතිවලින් ඒ බව මැනවින් පැහැදිලි වේ **(Deraniyagala 1992 : 711-712)**. නාගරික ක්‍රියාවලිය සමඟ අනුරාධපුරය ප්‍රධාන ජනාවාසය ලෙස ඉස්මතු වීමත් සමඟ ම එම ජනපදයට අවශ්‍ය බහු විධ සම්පත් හා භාණ්ඩ ඊට හාත්පස ප්‍රදේශවල පිහිටුවා ගන්නා ජනපද මගින් සැපයීම ආර්ථික විද්‍යානුකූල ව ද සිදු විය යුතු සිද්ධාන්තයකි. මධ්‍ය යාන් ඔය නිම්නය ආශ්‍රිත පූර්ව ඓතිහාසික ජනාවාස සාර්ව ලෙස ස්ථාපිත වීම සම්බන්ධයෙන් අධ්‍යයනය කර බැලුවහොත් හඳුනාගත හැකි වැදගත් කාරණය වන්නේ එම කාලයේ අන්තර් සමාජ සම්බන්ධතාවය යාන් ඔය මධ්‍ය නිම්නය හා අනුරාධපුරය අතර සිදු වී තිබූ බව ය.

හැඩ ගැසෙමින් ඇති ප්‍රාථමික ජන සමාජයක් ස්ථාවර ලෙස මුල්බැස ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් ම ඛනිජ සම්පත්වල පිහිටීම ඍජු ව බලපාන බව පුරාවිද්‍යා පර්යේෂණවල දී පෙන්වා දී තිබේ. යාන් ඔය නිම්නයේ පූර්ව ඓතිහාසික ජනාවාස ව්‍යාප්තවීමේ මොස්තරය අධ්‍යයනයේ දී එම ජනපද ස්ථානගත වීම උදෙසා ඛණිජ සම්පත්වල පිහිටීම ද බලපා ඇති බව හඳුනාගත හැකි ය. ඒ අතුරින් ලෝහ සම්පත් මධ්‍ය යාන් ඔය නිම්නයට ඉතා ආසන්න ප්‍රදේශවල ස්ථානගත වී තිබීම නිසා යකඩ

හා තඹ යන ඛනිජ සම්පත් පහසුවෙන් එම නිම්නයේ ජීවත් වූ වැසියන්ට පරිහරණය කිරීමට අවකාශ සැලසී තිබේ. ශ්‍රී ලංකාවේ යකඩ හා තඹ භාවිතය ආරම්භ වන්නේ පූර්ව ඓතිහාසික අවධියේ දී බව සුදර්ශන් සෙනවිරත්න පෙන්වා දී ඇත **(Senaviratne 1994 : 16)**. යාන් ඔය මධ්‍ය නිම්නයට ආසන්න කලාපයක් නිධිගත වී ඇති ලෝහයක් ලෙස මැග්නටයිට් තඹ ලෝහය සේරුවිල ප්‍රදේශයේ දී හමු වේ. 1971 වර්ෂයේ ශ්‍රී ලංකා භූ සමීක්ෂණ දෙපාර්තමේන්තුව සේරුවිල සිදුකර ඇති භූ විද්‍යා අධ්‍යනයන්ට අනුව මැග්නටයිට් තඹ (Copper Magnetite) සේරුවිල නිධිගත වී ඇති බව හඳුනාගෙන තිබේ **(Senaviratne 1995 :116)** පී. ජී. කුරේ පෙන්වාදෙන ආකාරයට මෙම මැග්නටයිට් තඹ නිධිය සම්භවය ලබා ඇත්තේ නැගෙනහිර විජයානු සංකීර්ණය හා උස්භූමි සංකීර්ණයට අයත් අන්තර් භූ කලාපයේ ය **(Cooray 1984 : 212; Senaviratne 1995 : 116)**. සේරුවිල ප්‍රදේශයේ දී මතුපිටට ප්‍රවිෂ්ට ව ඇති මැග්නටයිට් තඹ ටොන් මිලියන 07ක් එම භූමියේ මතුපිට මට්ටමේ සිට අඩි 200ක් පොළව අභ්‍යන්තරයට විහිදෙන බව ශ්‍රී ලංකා භූ සමීක්ෂණ දෙපාර්තමේන්තුව 1971 දී සිදු කළ පර්යේෂණවලින් තහවුරු කර තිබේ ***(ibid* ( 117*)*** මතු පිටින් ඉතා පහසුවෙන් ඉවත් කරගත හැකි ලෙස පිහිටා ඇති මෙම නිධියේ තඹ එහි විසූ පූර්ව ඓතිහාසක වැසියන් භාවිත කර ඇති ආකාරය සේරුවිල හාත්පස භූමිය පුරා විසී පවතින මහා පරිමාණ ලෝහ බොරවලින් පැහැදිලි වේ. මෙම තඹ නිධිය ආසන්නයේ පිහිටා ඇති මහින්දපුර සුසාන භූමිය (**තන්තිලගේ හා තවත් අය** 2016ඃ 1-8) පූර්ව ඓතිහාසික මිනිසුන් මෙම ස්ථානයේ ස්ථාවර ජනාවාස පිහිටුවා ගෙන තිබූ බවට කදිම සාධකයක් වේ.

ලෝහ පූර්ව ඓතිහාසික අවධියේ ජනතාවගේ ජීවන පැවැත්මට අදාළ සම්පත් පරිහරණ රටාවේ මූලික අංගයකි. සේරුවිල ලෝහ නිධියේ වූ ලෝහ ක්‍රි.පූ හය වැනි සියවස පමණ වන විට අනුරාධපුරයට රැගෙන විත් ඇති බව අනුරාධපුර ඇතුළු පුර පූර්ව ඓතිහාසික අවධියට අයත් ජනාවාස ස්ථරවලින් හමු වී ඇති ලෝහ මෙවලම් ආශ්‍රිත ව සිදු කර ඇති රසායනික මූලද්‍රව්‍ය විශ්ලේෂණයට අනුව හඳුනාගෙන තිබේ ***(ibid)***. එසේ ම මෙම කාලයට සම කාලීන ව මධ්‍ය යාන් ඔය නිම්නයේ පූර්ව ඓතිහාසික ජනාවාස වන ගුරුගල්හින්න, දිවුල්වැව. වඩිගවැව. කොක්එබේ, කදිරවේලි යන ස්ථානවලින් යකඩ හෝ තඹ වාර්තා වී ඇති බව රාජා ද සිල්වා එම ස්ථාන ආශ්‍රිත ව සිදුකර ඇති කැනීම්වලින් වාර්තා කර තිබේ **(Senaviratne 1984 ‘ 248 ‘ 257)**. මේ පිළිබඳ අධ්‍යයනය කර ඇති අර්ජුන තන්තිලගේ ප්‍රකාශ කර ඇත්තේ මේවා තඹ ද ලෝකඩ ද යන්න නිශ්චිත ලෙස රාජා ද සිල්වා ප්‍රකාශයට පත්කර නො මැති බව ය **(Thanthilage 2008; 202)**. එහෙත් ගුරුගල්හින්න ආශ්‍රිත ව තඹ උපකරණ ලැබී ඇති බව රාජා ද සිල්වා 1970 වර්ෂයේ වාර්තා කර ඇති බව සුදර්ශන් සෙනවිරත්න පෙන්වා දී තිබේ **(Senaviratne 1984 ; 248)**. එසේ ම වඩිගවැව ශිලා මංජුසා සුසානයක් ආශ්‍රිත ව යකඩ වාර්තා වී ඇති බව එස්. කේ. සිත්‍රපලම් පෙන්වා දී ඇති බව සුදර්ශන් සෙනෙවිරත්න ප්‍රකාශ කර තිබේ **(Senaviratne 1984; 248)**. අර්ජුන තන්තිලගේ පෙන්වා දී ඇති ආකාරයට ගුරුගල්හින්න ආශ්‍රිත ව වාර්තා වී ඇති ලෝහ මෙවලම් අතර තඹවලින් පමණක් නිර්මාණය කරන ලද ඒවා හමු වී

තිබේ. එසේ ම කොක්එබේ. වඩිගවැව. දිවුල්වැව. යන ස්ථාන ආශ්‍රිත ව යකඩ හා තඹ යන මාධ්‍ය දෙකෙන් ම නිර්මිත උපකරණ හමු වී තිබේ **(Thanthilage 2008 ; 202-203)**. තම්මැන්නාගොඩැල්ල ආශ්‍රිත සුසාන 2013 වර්ෂයේ කැනීම් කරන ලද රංජිත් දිසානායක එම සුසානවල තැන්පත් කර තිබූ රනින් නිමවා තිබූ පබළු. යකඩවලින් නිර්මිත වළලු, කරාබු, දුනු හිස් හා කෘෂි උපකරණ ද තඹවලින් නිර්මාණය කරනු ලැබූ ඇස් අලංකරණයට භාවිත කරන අංජන කූරු හා වළලු ද හමු වූ බව ප්‍රකාශ කර ඇත **(රංජිත් දිසානායක සමඟ සිදු කළ සම්මුඛ සාකච්ජාව උපුටා ගැනීම මනමේන්ද්‍රආරච්චි සහ අදිකාරි 2014; 216 - 217)**. සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වා දී ඇති ආකාරයට සේරුවිල පිහිටි තඹ පූර්ව ඓතිහාසික අවධියේ දී ලංකාවේ අනෙකුත් ජනපද වෙත ලබා දී ඇත. විශේෂයෙන් ම මධ්‍ය යාන් ඔය නිම්නයේ ස්ථාපිත පූර්ව ඓතිහාසික ජනතාව අනිවාර්යෙන් ම යාන් ඔය මධ්‍ය නිම්නයට ලෝහ අමුද්‍රව්‍ය ප්‍රවාහනය කර ලෝහ මෙවලම් නිෂ්පාදනය කරන්නට ඇති බව පෙන්වාදිය හැක්කේ ඊට පසු ව ඇති වන මුල් ඓතිහාසික සංස්කෘතික අවධියේ දී (Early histoty) එම ලෝහ සම්පත් අත්පත් කරගැනීමේ කාර්ය තීරණාත්මක වී ඇති ආකාරය කුරුණෑකල්ලු පූර්ව බ්‍රාහ්මී අභිලේඛන ඇසුරෙන් හඳුනාගත හැකි නිසා ය (**Ic.Vol.I 1970 ( No.319**). සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වාදෙන ආකාරයට එම ලිපියේ සඳහන් වන පරුමක තබර වෙල යන්න මගින් තඹ කර්මාන්තයේ නියැළි පරුමකවරුන් පිළිබඳ ව පැහැදිලි වන බව ප්‍රකාශ කර ඇත **(Seneviratne 1989;115)**. පරුමකවරුන්ගේ පාලන බලය සේරුවිල සිට අනුරාධපුරය දක්වා විහිදුණු නිෂ්පාදන බෙදා හැරීම් ජාලය ඔස්සේ හඳුනාගත හැකි අතර ලෝහ කර්මාන්තය ආශ්‍රිත ව විශේෂඥ ශිල්ප කටයුතුවල නියැලි පිරිස් මධ්‍ය යාන් ඔය නිම්නයේ පෙරියපුලියන්කුලම, කැබිතිගොල්ලෑව, බ්‍රාහ්මණයාගම, නැට්ටුක්කන්ද, කහටගස්දිගිලිය, හොරොව්පොතාන ආදි ස්ථාන ඇසුරෙන් ස්ථානගත වී සිට ඇති බව මුල් බ්‍රාහ්මී අභිලේඛන අනුව ද හඳුනාගත හැකි වේ. ඒ අතර තබකර (තඹකරු), තොපශ (බෙලෙක්කරු) ආදි ශිල්පීන් **(Ic.Vol. I; 1970 : No. 350, No. 351, No. 370)**. මෙන් ම යකඩ කර්මාන්තයට සම්බන්ධ විශේෂ ප්‍රාගුණ්‍යතාවයක් දැක් වූ ශිල්පීන් කබර (යකඩකරු) **(ibid. Vol. : No.161)**. මෙම ප්‍රදේශ ආශ්‍රයෙන් ජීවත් වූ බව හඳුනාගත හැකි වීම නිසා ඔවුන් පූර්ව ඓතිහාසික අවධියෙන් සම්භවය ලබා මුල් ඓතිහාසික අවධියේ දී දියුණුවට පත් වූ පිරිස් බව එ මගින් පැහැදිලි වන බව පෙන්වාදිය හැකි ය. මෙය තහවුරු කර හැක්කේ ලේඛකයා විසින් සිදු කළ ක්ෂේත්‍ර ගවේෂණවල දී හොරොව්පොතාන පළුගොල්ලාගම ප්‍රදේශයේ පුද්ගලික ඉඩමක පර්චර්ස් විස්සකට වඩා වැඩි භූමියක් පුරා මතුපිට යබොර ස්ථානගත ව තිබීම නිසා ය. මෙම යබොර විශාල කුට්ටි වශයෙන් දැකගත හැකි අතර එම ස්ථානය බොහෝ විට පූර්ව ඓතිහාසික යුගයේ යකඩ නිෂ්පාදනය කරනු ලැබූ ස්ථානයක් බවට උපකල්පනය කළ හැක්කේ එම ස්ථානයට නුදුරින් වලස්මුල්ල යන ග්‍රාමයේ ශිලා මංජුසා වර්ගයේ සුසාන භූමියක් ස්ථානගත වන බැවිනි. මෙම යබොර හමුවන ස්ථානය හා මෙම සුසානය පිහිටීම අනුව පූර්ව ඉතිහාසය තුළ සිදු වූ මහා පරිමාණ ලෝහ නිෂ්පාදන ස්ථානයක් හොරොව්පොතාන ක්‍රියාත්මක වීමට බොහෝවිට ඉඩ තිබේ. මේ පිළිබඳ ව ඉදිරි පර්යේෂණයක දී වැඩිදුරටත් තහවුරු කරගත යුතු ව තිබේ.

තඹ ලෝහ භාවිතය සමඟ දියුණු වන තවත් කර්මාන්තයක් වන්නේ වීදුරු නිෂ්පාදනය යි. වීදුරු නිෂ්පාදනයේ දී තඹ ලෝහයේ ඇති කොබෝල්ට් භාවිත කිරීම සිදු කරන අතර සේරුවිලට ආසන්නව පිහිටන ඉලංගතුරෙයි වරාය ආසන්නයේ පුරාණයේ එ වැනි වීදුරු කර්මාන්තයක් පැවැති ස්ථානයක් ලෙස හඳුනාගත හැකි සාධක තිබේ. ඉලංගතුයෙි වරාය සමඟ ඇති ජනාවාස ගොඩැල්ල තුළ වීදුරු නිෂ්පාදනය කරන ලද සාධක හමුවන අතර එම ජනාවාස ගොඩැල්ලේ මතුපිට කාලරක්ත වර්ණ මැටි මෙවලම් හමුවන බැවින් එම ස්ථානය පූර්ව ඓතිහාසික ජනාවාස පැවැති ස්ථානයක් බව පෙන්වාදිය හැකි ය.

ලෝහ සම්පත්වලට අමතර ව මෙම ප්‍රදේශ ඇසුරින් දැකගත හැකි ඛනිජ අතර තිරුවානා වර්ගවල පිහිටීම හඳුනාගත හැකි ය. වඩිගවැව සිට උතුර දෙසට විහිදෙන පාෂාණ වැටිය ආශ්‍රිත ව පිහිටන ඛනිජ තීරුවක තිරුවානා ඛනිජ බහුල ව දක්නට ලැබේ. විශේෂයෙන් ම කොක්එබේ සුසාන භූමිය ආශ්‍රිත ව 2016 වසරේ සිදු කරන ලද කැනීම්වල දී එම සුසාන අභ්‍යන්තරයෙන් මෙන් ම කැනීම් පරිශ්‍රවලින් ද දුම්පැහැ තිරුවානා (Smokey Quartz) හා විනිවිධ පෙනෙන තිරුවානා (Clear Quartz) වර්ග වාර්තා වී ඇත **(මැන්දිස් 2016 : 128-179)** එ මගින් මෙම යුගයේ දී එම ඛනිජ වර්ග එම ප්‍රදේශයේ නිවැසි පූර්ව ඓතිහාසික මිනිසුන් භාවිත කළ බව මැනවින් පැහැදිලි වේ. යාන් ඔය නිම්නයේ පූර්ව ඓතිහාසික අවධියේ ජනාවාස ව්‍යාප්තිය හඳුනාගැනීමේ දී දැනට එම ප්‍රදේශය ඇසුරින් හඳුනාගත හැකි මෙගලිතික සුසාන සංකීර්ණ හා ඒ ආශ්‍රිත ව හඳුනාගත හැකි සුසාන ආකෘතිවල සංවර්ධනය අධ්‍යයනය කිරීමෙන් ද එක්තරා ආකාරයකට පූර්ව ඓතිහාසික ජනාවාස රටාවේ ව්‍යාප්තවීමේ මෝස්තරය හඳුනාගැනීමට හැකි වේ. යාන් ඔය නිම්නයෙන් මේ වන විට මෙගලිතික සුසාන ස්ථාන 35කට වඩා වැඩි ප්‍රමාණයක් වාර්තා වන අතර ඒ අතර ආකෘති ගණනාවකට අයත් සුසාන පවතී. එම ආකෘති අතර ශිලා මංජුසා සුසාන (Cist Burial), ශිලා කේතුක සුසාන (Cairn Mound), ශිලා මණ්ඩල සුසාන(Cairn Circle), ශිලා මංඤ්චක සුසාන (Delmenoid Cist), බරණි සුසාන (Urn Pot) හා ශිලා පෙළ (Stone Allingment) **(Senaviratne 2007: 149-155; මැන්දිස් 2017 : 150-153)**. පවතින බව හඳුනාගෙන තිබේ. මෙම සුසාන ගොඩනගා ඇති වාස්තුවිද්‍යාව (Burial Architecture) පිළිබඳ ව විමර්ශනය කිරීමේ දී පූර්ව ඓතිහාසික ප්‍රජාව ඔවුන්ගේ තාක්ෂණික ක්‍රියාවලිය එක්තරා ආකායකට ක්‍රමානුකූල ව සංවර්ධනය කිරීම සිදුකර ඇති බවට එම සුසාන අකෘතිවලින් හඳුනාගත හැකි වේ. සංස්කෘතියක් ආරම්භක අවස්ථාවේ දී පරිණත භාවයට පත් නො වන අතර එය සංවර්ධනය වීම සඳහා තාක්ෂණ ශිල්පයේ වර්ධනය සමඟ ජනරේඛනයේ ප්‍රසාරණය හා සම්පත්වලට ඇතිවන ඉල්ලුම වර්ධනය විය යුතු ය. ප්‍රාථමික ජන සමාජයක් සංවර්ධනය කරා ළඟා වීමේ මිණුම් දණ්ඩක් ලෙස එම සංස්කෘතියේ වාස්තුවිද්‍යා අංගවල මෙන් ම කලා නිර්මාණ හා තාක්ෂණික අංශයන්ගේ සංවර්ධනයක් ද හඳුනාගත හැකි වේ.

යාන් ඔය නිම්නයේ ස්ථානගත වී ඇති සුසාන ආශ්‍රිත වාස්තුවිද්‍යාව අධ්‍යයනයෙන් එක්තරා ආකාරයකට පැහැදිලි වන්නේ එම සමාජය සංවර්ධනය

කරා ළඟාවීමේ දී එකිනෙකට වෙනස් සුසාන ආකෘති හඳුන්වා දීම සිදුකර ඇති බව ය. යාන් ඔය නිම්නයේ දක්නට ලැබෙන සුසාන ආකෘති අතුරින් බහුතර සුසාන ආකෘතිය වන්නේ ශිලා මංජුසා (Cist Burial) සුසාන ආකෘතිය වේ. එසේ ම මේ වන විට එම සුසාන ආකෘතියට අයත් සුසානවලින් පැරණිතම කාලනිර්ණ ලැබී ඇත්තේ කොක්එබේ ශිලා මංජුසා සුසානයකිනි. එහි කාලනීර්ණ ක්‍රි.පූ 790 වේ Beta 444431 **(මැන්දිස් 2017 : 178)** කොක්එබේ සුසාන භූමිය ආශ්‍රිත ව වාර්තා වන අනෙක් සුසාන ආකෘති ලෙස ශිලා කේතුක සුසාන (Cairn Mound), ශිලා පෙළ(Stone Alignment) බරණි සුසාන (Urn Pot) පවතින බව පෙන්වාදිය හැකි ය. කොක්එබේ සුසාන ආකෘතිවලින් මීළගට පැරණි කාලනිර්ණ ලැබී ඇත්තේ ශිලා පෙළ සුසානය(Stone Alignment) සඳහා ය. එහි කාලනිර්ණ ක්‍රි.පූ 770 වේ Beta 444432 **(මැන්දිස් 2017: 177-179).** මෙම ශිලා පෙළ සුසානය මීටර් 15 දිගට එක පෙළට සිටුවන ලද ශිලා පුවරු දෙපසින් සුසාන බරණි තැන්පත් කර නිර්මාණය කර තිබෙන සුසානයකි. මෙම සුසානයේ 2016 වර්ෂයේ දී පුරාවිද්‍යා කැනීම සිදු කරනු ලැබුවේ එහි හරියට ම මැද කොටසේ මීටර් 4 × 2 ප්‍රමාණයේ පරිශ්‍රයක ය. එම කැනීම් පරිශ්‍රයේ පමණක් සුසාන බරණි 25 කැනීමේ දී වාර්තා විය. මෙම ශිලා පෙළ සුසානය නිර්මාණය කර ඇත්තේ බොහෝ විට එක් පවුලක සුසානයක් ලෙස හෝ එසේ නොමැති නම් පොදු සුසානයක් ලෙස බව උපකල්පනය කළ හැක්කේ එ තරම් විශාල සුසාන බරණි ප්‍රමාණයක් එහි දක්නට ලැබෙන බැවිනි. මෙම ශිලා පෙළෙහි ආරම්භය එහි දෙකෙළෙවරෙහි කුමන කොටසින් සිදු වූවා දැයි තව ම නිශ්චය කර නොමැත. කෙසේ වෙතත් මෙම සුසානය කොක්එබේ මෙගලිතික සුසානයේ පැරණිතම සුසානය විය හැකි බව උපකල්පනය කළ හැක්කේ එහි මැද කොටසේ කාලනිර්ණ ක්‍රි.පූ 770 තරම් පැරණි වන නිසාත් එහි ආරම්භය බොහෝ විට ක්‍රි.පූ 1000 හෝ ඊට පෙර කාලයට ගමන් කිරීමට වැඩි ඉඩ ප්‍රස්තා තිබෙන බැවිනි. එසේ ම සුසාන ආකෘතියක් ලෙස ඉතා ප්‍රාථමික ආකාරයකට නිර්මාණය කර ඇති මෙම සුසානය එම සංස්කෘතියේ සංවර්ධන අවස්ථාවක නො ව සමාරම්භක අවස්ථාවක නිර්මාණය කරන ලද්දක් විය හැකි බව ද පෙන්වාදිය හැකි ය. කොක්එබේ සුසාන භූමිය ඇසුරින් සිදු කළ පර්යේෂණ කැනීම්වලින් ලැබී ඇති මීළඟ කාලනීර්ණය ක්‍රි.ව 5 - 125 Bete 444430 කාලයට අයත් වන බැවින් දළ වශයෙන් මෙම සුසානය අඛණ්ඩ ව අවුරුදු 920ක් පමණ භාවිත වී තිබෙන බව පෙන්වාදිය හැකි ය. එසේ ම සුසාන ආකෘතිවල සංවර්ධනය දෙස විමර්ශනය කිරීමේ දී බරණි සුසාන මෙම සංස්කෘතියේ පැරණි සුසාන වන බව විමලා බෙග්ලි පොම්පරිප්පුව සුසානයෙන් පැහැදිලි කර තිබෙන අතර යන් ඔය නිම්නයේ ද එ වැනි බරණි සුසාන මල්පෝරුව කොක්එබේ හා තම්මැන්නාගොඩැල්ල යන ස්ථානවල හඳුනාගෙන තිබේ **(මැන්දිස් 2017 : 150-153 ; Dissanayake 2018: 57-58)**. මෙම සුසාන ආකෘතිවලට පසු ව බොහෝවිට ශිලා මණ්ඩල, ශිලා කේතුක සුසාන, ශිලා ටැඹ සුසාන හා ශිලා මංඤ්චක සුසාන යාන් ඔය නිම්නයේ වර්ධනය වන්නට ඇති බව උපකලපනය කළ හැකි ය.

ඒ අනුව යාන් ඔය නිම්නයේ පූර්ව ඓතිහාසික අවධියේ ජනාවාස ව්‍යාප්තවීමේ මෝස්තරය දැනට සිදු කර ඇති අධ්‍යයනය අනුව විමර්ශනය කිරීමේ දී පැහැදිලි

වන්නේ එහි මධ්‍ය කොටසේ මුලින් ස්ථාපිත වූ ජන කණ්ඩායම් ක්‍රමානුකූල ව සීගිරිය නිම්නය දෙසට හා පුල්මුඩේ දෙසටත් ව්‍යාප්ත වී ඇති බව ය. එය එසේ පෙන්වාදිය හැක්කේ සීගිරියට නුදුරු කලවැල්ලා උල්පත ස්ථානයේ ඇති මෙගලිතික සුසානයේ කාලනීර්ණ ක්‍රි.පූ 520-200 **(Jayaratne 2016:27)**. දළ වශයෙන් වසර තුන්සිය විස්සක් භාවිත වී තිබේ. කොක්එබේ කාලනීර්ණ ක්‍රි.පූ 790 ක්‍රි.ව 125 දළ වශයෙන් වසර 950 භාවිත වී තිබේ **(මැන්දිස් 2017: 178)**. හා තම්මැන්නාගොඩැල්ල ක්‍රි.පූ 490 ක්‍රි.ව 350 **(දිසානායක 2017 වර්ෂයේ සිදු කළ සාකච්ඡාව)**. දළ වශයෙන් වසර 750 ක් භාවිත වී තිබේ. එසේ ම වාහල්කඩ ක්‍රි.පූ 400-200 දළ වශයෙන් වසර 200 භාවිත වී තිබෙන බව **(එස්.ටී.ජී ප්‍රියන්ත සමග 2018 සිදු කළ සම්මුඛ සාකච්ඡාව)**. කාලනිර්ණ අනුව පැහැදිලි වන බැවිනි. එසේ ම මධ්‍ය යාන් ඔය නිම්නයේ කහටගස්දිගිලිය, හා හොරොව්පොතාන ප්‍රදේශීය ලේකම් කොට්ඨාශවල ස්ථානගත ව ඇති මෙගලිතික සංස්කෘතියට අයත් සුසාන අතුරින් විවිධ ආකෘතියේ සුසාන ආකෘති මෙම ප්‍රදේශ ඇසුරින් ස්ථානගත ව තිබේ. ඒ අතුරින් මෙ රට දුර්ලභ ඝනයේ සුසාන ආකෘතියක් වන ශිලා කේතුක සුසානඃ Cairn Mound / Cairn Heap) කොක්එබේ, පරංගියාවාඩිය, හුරුළු නිකවැව වලස්මුල්ල යන ස්ථානවල දක්නට ලැබේ. එසේ ම තවත් සුවිශේෂ සුසාන ආකෘති බවට උපකල්පනය කළ හැකි ශිලා ටැඹ (Menhir) වර්ගයේ සුසානයක් තම්මැන්නාගොඩැල්ල ආශ්‍රිතවත් ශිලා මඤ්චක සුසානයක් (Delmenoid) වර්ගයේ සුසාන වියහැකි සුසාන ගල් ඇඳ කටුවේ හා වාහල්කඩ තිබීමෙන් පැහැදිලි වන්නේ ද මධ්‍ය යාන් ඔය නිම්නයේ පොකුරක් ආකාරයට ස්ථාපිත වූ පූර්ව ඓතිහාසික ප්‍රජාව ක්‍රමානුකූල ව ජනරේඛනයේ ප්‍රසාරණය සමග යාන් ඔයේ ඉහළට හා පහළට ගමන් කර සිය ජනාවාස පිහිටුවා ගෙන තිබීම නිසා එම ජනාවාස ව්‍යාප්ත වීමේ රටාව මධ්‍ය යාන් ඔය නිම්නය කේන්ද්‍රගත කර ගෙන සංවර්ධනය වී ඇති බව ය. දැනට සිදුකර තිබෙන පුරාවිද්‍යා අධ්‍යයන අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ පූර්ව ඓතිහාසික අවධියේ ජනාවාස අනුරාධපුර ඇතුළුනුවර ඇසුරින් වාර්තා වී තිබුණ ද මෙම සංස්කෘතිය යාන් ඔය නිම්නයේ ආරම්භ වී අනුරාධපුර දෙසට ව්‍යාප්ත වීමට බොහෝ ඉඩ ප්‍රස්තා පවතින බව පෙන්වාදිය හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

මනමේන්ද්‍ර ආරච්චි සහ ගාමිණි අදිකාරි, 2014., **අනුරාධපුර පුරා ජෛව විවිධත්වය හා වර්තමාන ජෛව විවිධත්වය, ජෛව විවිධත්ව ලේකම්** කාර්යාලය, පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය කොළඹ:

මැන්දිස්, තුසිත 2008., **වෙස්සගිරිය බඩවැටි පර්යේෂණ කැනීම**, වාර්ෂික පුරාවිද්‍යා වාර්තාව2006, සංස් සුදර්ශන් සෙනෙවිරත්න හා පියතිස්ස සේනානායක, මධ්‍යම සංස්කෘතික අරමුදල සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, කොළඹ. 48-56.

මැන්දිස්, තුසිත 2016., **මධ්‍ය යාන්ඔය නිම්නයේ පූර්ව ඓතිහාසික අවධියේ සුසාන ආශ්‍රිත වාස්තු විද්‍යාව**, **The Proceeding of Second Archaeology Research Symposium, Department of Archaeology and Heritage Management**, Rajarata University of Sri Lanka, Mihinthale.150-153.

මැන්දිස්, තුසිත, අබේවර්ධන නුවන්, විතානාච්චි, චන්දන රෝහණ, 2016, **අනුරාධපුර දීඝ පාෂාණය ආශ්‍රිත මානව ජනාවාසකරණය**, කර්තෘ ප්‍රකාශන.

මැන්දිස්, තුසිත 2017, **කොක්එබේ මෙගලිතික සුසාන භූමිය ආශ්‍රිත කැනීම, මධ්‍ය යාන් ඔය නිම්නයේ ජනාවාස පුරාවිද්‍යාව**, පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ: 128-179.

තන්තිලගේ, ආර්., අයි. විතානගේ., ජේ සේනානායක., ටී.ඩී. සී. පුෂ්පකුමාර, 2016., **සේරුවිල තඹ නිධිය ආශ්‍රිත මෙගලිතික සුසාන භූමි**, PGIAR Publication.

Cooray, P.G.1984., ***an Introduction to the Geology of Sri Lanka*** (Ceylon), Colombo: National Museums of Sri Lanka.

Deraniyagala, S.U.1972., The Citadel of Anuadhapura: Excavation in the Gedige area, ***Ancient Ceylon no.02***, 48-165, Archaeological Survey Department, Colombo.

1992., ***The Prehistory of Sri Lanka***, an Ecological Perspective, Archaeological Survey Department, Colombo.

Deraniyagala,S.U. & M. Abeyratne, 1997., Rediocarbon Chronology of Anuradhapura,Sri Lanka:A Revised Age Estimate, ***South Asian Archaeology***, vol.ii Stituto Italiano Per Africa Luriente, 2000.

Dissanayake, R. B., 2018 , ***Traversing the Megalithic Funery Landscapes***, The Yan Oya Middle Basing Archaeology , PGIAR Publication.

Jayarathne, D. K. 2016., Geoarchaeoloical Approach to the Ihala Kalawella Ulpatha Cist Burial Site and It's Adjoining Cultural Landscape at Anuradhapura District of Sri Lanka.***Ancient Ceylon No. 25***, Department of Archaeology,Sri Lanka. 25-42.

Paranavitane, S. 1970. ***Inscription of Ceylon***, Vol. I, Department of Archaeology. Colombo:

Seneviratne , S.1984., The Archaeology of the Megalithic - Black and Red Ware Complex in Sri Lanka, ***Ancient Ceylon*** No.5: 237-305, Archaeological Survey Department, Colombo:

1989 - Pre State Chieftain and Servants of the State : A case study of the parumuka. In ***the Sri Lanka Journal of Humanities***. Vol. XV.No.1 & 2 99-131, University of Peradeniya.

1995., The Ecology and Archaeology of the Seruwila: Copper Magnetite prospect North- East Sri Lanka In ***Sri Lanka Journal of Humanities***. Vol. xxi (1&2):114-146

2007., **The Archaeology of the Megalithic - Black and Red Ware Complex in Sri Lanka**, ***Art and Archaeology of Sri Lanka,*** Central Cultural Fund, Ministry of Cultural Affirs, 135-202.

1996., Peripheral Regions and Marginal Communities : Towards an Alternative Explanation of Early Iron age Maternal and social Organization in Sri Lanka ***Tradition Dissent and Ideology : Essay in Honor of Romila Thapar***, ed. K. Campakalakshmi and S.Gopal, Oxford University Press. Delhi: 265-312

Thanthilage, A.2007., **An Archaeo-Metallurgical Investigation of Sri Lankan Historical Bronzes**, Unpublished PhD Thesis.





උතුරු පළාතේ ධීවරයන් වර්තමායේ දී මුහුදුදේ මසුන් මැරීම සඳහා භාවිත කරන කට්ටුමරන් නැමති සරල යාත්‍රා විශේෂය

යාන් ඔය නිම්නයේ පූර්ව ඓතිහාසික ජනාවාස ව්‍යාප්ත වීමේ මෝස්තරය හා එහි මෙතෙක් ලබා ගෙන ඇති කාලනිර්ණ දැක්වෙන සැලසුම




අනුරාධපුරය හා පර්යන්ත කලාපයේ පූර්ව ඓතිහාසික ජනාවාසවල ව්‍යාප්තවීම

